# ලෝක බැංකු ශ්‍රී ලංකා කාර්යාලය සිවිල් සමාජ අරමුදල - 2010 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**2010 පෙබරවාරි 25 වන දින කොළඹ දී:** 2010 සිවිල් සමාජ අරමුදල (CSF 2010) සඳහා ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සිවිල් සමාජ සංවිධාන වලින් ලෝක බැංකු කොළඹ කාර්යාලය අයදුම්පත් කැඳවයි.

***"සංවර්ධනය සහ කාලගුණික විපර්යාස - ශ්‍රී ලංකාවේ වියළි කළාපය තුළ ප්‍රජා නම්‍යශීලීත්වය ගොඩනැංවීම"*** යන්න 2010 සිවිල් සමාජ අරමුදලෙහි තේමාවයි. අයදුම්පත් කැඳවනු ලබන්නේ ගෘහස්ථ මට්ටමේ තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේදයන්, ජල කළමනාකරණය සහ ඝන අපද්‍රව්‍ය කළමණාකරණයට අදාළ ප්‍රජා පාදක ප්‍රාරම්භකයන් තුළින් කාළගුණික විපර්යාසයන්ට අනුගත වීමේ සහ ඉන් ඇතිවන බලපෑම සමනය කිරීමේ නව්‍ය යාන්ත්‍රණ යෝජනා කරනු ඇති ව්‍යාපෘති සඳහාය.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනයේ නියුතු ප්‍රධාන භූමි ප්‍රදේශයක් ද වන වියළි කලාපයේ ජීවත් වන ජනයා මුහුණ දෙන විශාලතම අභියෝගයක් ලෙස ජල හිඟය හැදින්විය හැකි වේ. " කාළගුණික විපර්යාසයන් ඇති වීමට බලපාන හේතු සහ එමඟින් ඇති කරනු ලබන ප්‍රතිවිපාක පිළිබඳ කටයුතු කිරීම සඳහා නව්‍ය ප්‍රවේශ ඇති කර ගැනීම අනාගතය සඳහා ඉතා තීරණාත්මක වනු ඇත." යනුවෙන් "සංවර්ධනය සහ කාළගුණික විපර්යාස" පිළිබඳව මෑතදී 2010 ලෝක සංවර්ධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කරමින් ලෝක බැංකු රාජ්‍ය අධ්‍යක්ෂ නඔකෝ ඉෂි මහතා පවසයි.

මෙම වසරේදී එක් අයෙකුට ඇ. ඩොලර් 9000 ක් දක්වා වු ප්‍රදානයන් පහක් පිරිනමනු ඇත.

තමන් හට වෙනත් සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් පරිපූරක අරමුදල් ලබා ගැනීමට ලෝක බැංකුව විසින් සිදු කරනු ලබන ප්‍රදානයක් කෙසේ උපකාර වේ දැයි විස්තරයක් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරන සංවිධාන වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය කරනු ලබන සමස්ත වියදමෙන් අවම වශයෙන් සියයට 20 ක ප්‍රමාණයක් වත් අයදුම් කරනු ලබන සංවිධානය විසින් මුදල් හෝ වෙනත් ඊට සමාන ආකාරයකින් තම යෝජිත අයවැයෙන් පෙන්නුම් කළ යුතුවේ.

පෙර වර්ෂයන්හිදී මෙම වැඩසටහන මඟින් ආධාර නොලැබූ සංවිධාන මේ සඳහා ඉදිරිපත් වීම දිරිමත් කරනු ලැබේ. පස් අවුරුදු කාලයක් තුළ සිවිල් සමාජ අරමුදලින් ප්‍රදානයන් තුනකට වඩා ලැබීමට කිසිදු සංවිධානයක් සුදුසුකම් නොලබයි.

මේ සඳහා ව්‍යාපෘති තක්සේරුවට ලක් කර ඇත්තේ ඒවායෙහි අඩංගු පහත දැක්වෙන කරුණු පිළිබඳ සලකා බැලීමෙනි.

1. **සඵලදායී බව :** අනෙකුත් රාජ්‍ය/ පෞද්ගලික අංශයේ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් යෝජිත ක්‍රියාකාරකම් හි තිරසාර භාවය ප්‍රදර්ශනය කිරීමේ හැකියාව.

2. **ප්‍රායෝගික බව :** ප්‍රායෝගික කාල රාමුවක් සහ අයවැයක් සහිත ප්‍රායෝගික ප්‍රවේශයක් පෙන්නුම් කිරීම.

3. **සංවිධානමය හැකියාව :** සංවිධානයට සම්බන්ධ කාර්ය මණ්ඩලය සතු කුසලතා හා හැකියාවන් මෙන්ම මේ හා සමාන ප්‍රමාණයකින් හා වපසරියකින් යුතු ව්‍යාපෘතියක් මෙහෙයවීමේ පළපුරුද්දක් වේ දැයි සඳහන් කිරීම.

4. **ප්‍රජාව තුළ සංවිධානය කෙරෙහි ඇති විශ්වාසනීයත්වය.**

5. **වැදගත්කම :** ව්‍යාපෘතිය මඟින් උපකාර කිරීමට යෝජිත ප්‍රජාව තුළ යම් වෙනසක් ඇති කිරීමට ඊට ඇති හැකියාව සහ ඉන් අපේක්ෂිත ප්‍රතිඵල වාර්තා කිරීමට පැහැදිලි යාන්ත්‍රණයක් තිබීම.

සිවිල් සමාජ අරමුදල මඟින්, පර්යේෂණ වැඩසටහන්, විධිමත් උසස් අධ්‍යාපන පුහුණු වැඩසටහන්, මෙහෙයුම් ව්‍යාපෘති, දැනට පවත්වා ගෙන යනු ලබන ආයතනික හර ආධාර (ක්‍රියාකාරිත්වයට අදාල නොවන උපකරණ වැනි) ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, අධ්‍යාපන වැඩසටහන්, තමන් විසින් තමන් සඳහා අයදුම් කරන පුද්ගලයින් හෝ නීතිමය නොවන වපසරීන් වෙත ආධාර ප්‍රදානය කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න.

සියලු අයදුම්කරුවන් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි, මනා ස්ථාවරත්වයක් සහිත, ප්‍රජාව තුළ යම් ජයග්‍රහණ ලැබූ ඉතිහාසයක් සහිත සහ මනා මූල්‍යමය විශ්වාසනීයත්වයකින් යුතු සමාජ සංවිධාන විය යුතු වේ. අරමුදල එක් සංවිධානයකින් එක් අයදුම්පතක් පමණක් භාර ගනු ලැබේ.

සිවිල් සමාජ සංවිධාන අරමුදල සඳහා අයදුම්පත්‍ර සහ උපදෙස් සහ සිංහල, ඉංග්‍රීසි සහ දමිළ යන භාෂා තුනෙන්ම ලියවුණු "යෝජනා පත්‍රයක් ලිවීම සඳහා කෙටි පාඨමාලාව" යනුවෙන් වූ කුඩා අත්පොතක් කොළඹ 3, ගාලු පාරේ අංක 73/5 දරණ ස්ථානයේ පිහිටි ලෝක බැංකු කොළඹ කාර්යයාලයේ විමසීම් කවුන්ටරයෙන් හෝ www.worldbank.lk යන වෙබ් අඩවිය හරහා ලබාගත හැක.

අයදුම්පත් පිටපත් ලබා ගැනීමට සහ සිවිල් සමාජ අරමුදල සම්බන්ධ වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා infosrilanka@worldbank.org යන ලිපිනයට ඊ - මේල් පණිවුඩයක් එවීමෙන් හෝ පහත සම්බන්ධකය හරහා මෙම වෙබ් අඩවිය තුළින් භාෂා තුනෙන්ම, අයදුම් කිරීම සඳහා අවශ්‍ය සියලු ලිපි ලේඛන ලබා ගත හැක.

සිවිල් සමාජ සංවිධාන අරමුදල සඳහා අයදුම්පත්‍ර ලේඛන ලබා ගන්න

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010 **මාර්තු මස** 30 වන දින වේ.